# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.09.08 |

**කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයින්ට ලබා දුන් සහන තවදුරටත් දීර්ඝ කෙරේ**

කොවිඩ්-19 වසංගත තත්ත්වය ඉහළ යාම හේතුවෙන් බලපත්‍රලාභී බැංකුවල ණය ගනුදෙනුකරුවන් මුහුණ දී තිබෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්,එම බලපෑමට පත් ණය ගනුදෙනුකරුවන් සඳහා මින් පෙර (එනම්, 2021.08.31 දින දක්වා) ලබා දී තිබූ ණය සහන 2021.12.31 දක්වා තවදුරටත් දීර්ඝ කිරීමට සලකා බලන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) වෙත දැනුම් දෙන ලදී. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චිතව දක්වන ලද සමස්ත ප්‍රතිලාභයන්ට වඩා නොඅඩු වන සේ, බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට ඔවුන් ඉල්ලා සිටින අතිරේක සහනයන් ලබා දීමට සලකා බලන මෙන් බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටී.

කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට පත් ණය ගනුදෙනුකරුවන් හට 2022 ජනවාරි මස සිට සිය ණය ගෙවීම් ක්‍රමානුකූලව සිදුකරගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සකස්කර ගැනීමට මෙම නව ණය සහන කාලය උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, පවත්නා තත්ත්වය යටතේ තම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දිගින් දිගටම එල්ල වන බාධා හමුවේ අත්‍යාවශ්‍ය මෙහෙයුම් වියදම් දරමින් සිය තැන්පතුකරුවන්ගේ පොලී මුදල් හා තැන්පතු මුදල් නිසි කලට වේලාවට ගෙවීමේ වගකීම බලපත්‍රලාභී බැංකු විසින් නොපිරිහෙලා ඉටුකරන බව අවධාරණය කළ යුතු වේ. මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, ණය සහන ලබා ගැනීමට සුදුසුකම් සපුරා ඇති නමුත්, ණය ආපසු ගෙවීමට හැකියාව පවතින ණය ගනුදෙනුකරුවන්ට තම පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ඉල්ලා සිටීම වෙනුවට ණය ආපසු ගෙවීමට කටයුතු කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලා සිටී. තවද, බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ ධාරිතාව ගැන සැලකිලිමත් වෙමින් ඔවුන්ගේ එදිනෙදා කටයුතුවලට අනිසි පීඩනයක් ඇති නොවන ආකාරයට එම ණය පහසුකම් ආපසුගෙවීම සඳහා නව සැලසුම් සැකසීමට බලපත්‍රලාභී බැංකු හා සාධාරණ එකඟතාවයකට පැමිණෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ණය සහන සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත 2021.09.01 දින නිකුත් කරන ලද 2021 අංක 08 දරන චක්‍රලේඛය ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ (www.cbsl.gov.lk) දක්වා ඇති අතර, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන් හට වැඩිදුර තොරතුරු අදාළ බලපත්‍රලාභී බැංකුව/බැංකු හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංක 1935 හෝ දුරකථන අංක 0112 477966 හෝ 0112 477129 ඔස්සේ සම්බන්ධ වීමෙන් ලබා ගත හැක.

මීට අමතරව, සංචාරක හා මගී ප්‍රවාහන යන ආර්ථික අංශයන්හි පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන් සඳහා මේ වන විටත් ණය සහන යෝජනා ක්‍රම දෙකක් 2020.09.30 දක්වා ක්‍රියාත්මක වේ.

කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැපයීම සම්බන්ධව නිකුත් කරන ලද 2021 අංක 08 දරන චක්‍රලේඛයේ මූලිකාංග පහත දක්වා ඇත.

**සක්‍රීය ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති සහන**

- **ණය ආපසු ගෙවීම 2021 දෙසැම්බර් මස අග දක්වා කල් දැමීම**: 2021.09.01 දින වන විට සක්‍රීයව ඇති ණය පහසුකම් සඳහා, රැකියාව අහිමි වීම, වැටුප්/ආදායම හෝ වෙළඳාම් අඩු වීම හෝ අහිමිවීම, ව්‍යාපාර කටයුතු අඩාල වීම, බිඳවැටීම හෝ ව්‍යාපාර වසා දැමීම යනාදි කරුණු එක් එක් අවස්ථාව අනුව සලකා

බලා 2021.12.31 දක්වා කාලය තුළ මුල් ණය මුදල හෝ පොලිය හෝ එම කොටස් දෙකම අයකර ගැනීම කල් දමනු ඇත. මේ අනුව, මෙම සහනය ලබාගන්නා ණයගනුදෙනුකරුන්ට ඔවුන්ගේ දැනට පවතින ණය පහසුකම් ආපසු ගෙවීම් ආරම්භ කිරීමට සිදුවනුයේ 2022.01.01 දින සිට ය.

- **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වලට ප්‍රමුඛතාවය ලබා දීම:** ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි නිරතව සිටින ණය ගැනුම්කරුවන් විසින් සහන සඳහා කරන ලද ඉල්ලීම් වලට බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රමුඛත්වය දිය යුතුය.

- **මීට පෙර ණයසහන/වාරික කල් දැමීම් යටතේ ලබාගත් ණය ඒකාබද්ධ කිරීම**: කලින් පැවති ණය සහන/වාරික කල් දැමීමේ යෝජනාක්‍රමවලට අදාළ කාල සීමා සඳහා අයවීමට නියමිත මුදල් (මුල් ණය මුදල, පොලිය සහ අදාළ කල් දැමූ කාල සීමාව සඳහා අයකරන පොලී) සහ මෙම සහනයෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් (මුල් මුදල සහ පොලී) නව ණය පහසුකමකට හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

- **කල් දැමූ වාරික (නව ණය පහසුකම) ආපසු ගෙවීම 2022.07.01 දින සිට ඇරඹේ:**

  - කල්බදු පහසුකම් ඇතුළුව, වාරික ණය සඳහා ඉහත නව ණය පියවීමට, බලපත්‍රලාභී බැංකු සහ ණය ගනුදෙනුකරු විසින් 2022.07.01 දින සිට මාස 6 දක්වා ආපසු ගෙවීමේ කාලසීමාවකට එකඟ විය යුතුය.
  - ණය ගනුදෙනුකරුට අවශ්‍ය නම්, මෙම නව ණය ආපසු ගෙවීම ඊට පෙර වුවද ආරම්භ කළ හැකිය. නැතහොත්, නව ණය පියවීම සඳහා මාස 6 කට වඩා වැඩි කාලයක් අවශ්‍ය යැයි හැඟේ නම්, ඒ සඳහා ඉල්ලීමක් කළ හැකිය. එවැනි අවස්ථාවක දී බැංකුව සහ ගනුදෙනුකරු සුදුසු සහනදායී පොලී අනුපාතයකට එකඟ විය යුතුවේ.

- **නව ණය පහසුකම සඳහා සහනදායී පොලී අනුපාතයක් අය කිරීම:**

  - රුපියල් ණය පහසුකම් - ඉහත සඳහන් කළ නව ණය මත, මාස 6 දක්වා ආපසු ගෙවීමේ කාලයක් සඳහා වාර්ෂිකව 6.93% (එනම්, 31.08.2021 දිනට දින 364 ක භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතය + 1% වා.පො.) නොඉක්මවන පොලී අනුපාතයක්, 2021.09. 01 දින සිට ආරම්භ වන පරිදි අය කිරීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව ඇත.

  - විදේශ මුදල් ණය සහ මාස 6ට වඩා වැඩි ආපසුගෙවීමේ කාලයක් සහිත රුපියල් ණය - බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු සහන පොලී අනුපාතයක් අය කළ යුතුය.

- **කෙටිකාලීන චක්‍රීය ණය පහසුකම් (Revolving facilities) පියවීම් දින 2021.12.31 දක්වා දීර්ඝ කිරීම**: ඒ ඒ අවස්ථාව සලකා බලමින්, කාරක ප්‍රාග්ධන, උකස්, තාවකාලික අයිරා, කෙටිකාලීන වෙළඳ මූල්‍යකරණ පහසුකම් ඇතුළු 2021.09.01 දින සිට 2021.12.31 දින දක්වා පියවීමේ දින සහිත චක්‍රීය ණය පහසුකම් පියවීම සඳහා 2021.12.31 දක්වා කාලය ලබා දෙනු ඇත. මෙම කල්දමන ලද කාල සීමාවට සහ අදාළ කල්දමන මුදල මත පමණක් ඉහත සඳහන් කර ඇති පරිදි පොලී අය කිරීමට බලපත්‍රලාභී බැංකු හට හැකියාව පවතී.

- **ණය සහන කාලය තුළ දඩ පොලී අය කිරීමක් හෝ එකතු කිරීමක් නොකළ යුතුය.** එනම් 2021.09 01 සිට 2021.12.31 දක්වා කාලය තුළ අයවීමට නියමිත මුදල් මත දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

- **ඔබට වඩාත් ගැලපෙන ක්‍රමය හඳුනා ගන්න:** ණය ගැණුම්කරුට දැනුවත් තීරණයක් ගැනීමට හැකි වන පරිදි, කල් දැමූ වාරික ඉක්මනින් ආපසු ගෙවීම ආරම්භ කිරීමේ ප්‍රතිලාභ සහ ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම නිසා ගනුදෙනුකරුට වන බලපෑම් පිළිබඳව පැහැදිලි කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතු වේ.

- **ණය ආපසු ගෙවීමේ ධාරිතාවට සරිලන පරිදි ණය ප්‍රතිව්‍යුහගත (restructure) කිරීමේ අවස්ථාව ලබා දී ඇත:** ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ ධාරිතාව සහ එවැනි ගනුදෙනුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන පිළිගත හැකි ව්‍යාපාර නඟාසිටුවීමේ සැලැසුම් (revival plan) සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට බලපත්‍රලාභි බැංකු හට හැකියාව පවතී.

- **ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ඇති නමුත් තම පහසුකම් කලින් පියවා දැමීමට කැමති ගනුදෙනුකරුවන් සඳහා පිරිනැමිය යුතු ප්‍රතිලාභ:** සහන ලබා ගැනීමට සුදුසුකම් ඇති නමුත් එසේ සහන ලබා නොගෙන ණය සහන කාලය තුළ දී තම ණය පහසුකම් කලින් පියවීමට කැමති ගනුදෙනුකරුවන් හට පොලී ප්‍රතිදාන (interest rebates) ලබා දීමට බලපත්‍රලාභී බැංකු දිරිමත් කරන අතර, එසේ ණය සහන කාලය තුල තම ණය පහසුකම් කලින් පියවන ගනුදෙනුකරුවන්ගෙන් කලින් පියවීමේ ගාස්තු සහ කල්බදු පහසුකම් සඳහා අනාගත පොලී ආපසු අයකර ගැනීම ඇතුළු අනෙකුත් ගාස්තු කපා හැරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතු වේ.

**අක්‍රීය ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති සහන**

- **අක්‍රිය ණය ප්‍රතිලේඛනගත (reschedule) කිරීම:** ණය ගැනුම්කරුගේ ආපසු ගෙවීමේ ධාරිතාව සහ පිළිගත හැකි ව්‍යාපාර යළි නඟා සිටුවීමේ සැලැස්මක් ඇති නම්, ඒවා සලකා බලා එක් එක් අවස්ථාව අනුව, 2021.09.01 දින වන විට, අක්‍රීය කාණ්ඩයේ පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කිරීම සිදුකළ හැකිය.

- **2020.04.01 දින හෝ ඉන් පසුව අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට අදාලව, සියලුම ණය නැවත අයකිරීමේ ක්‍රියාමාර්ග 2021.12.31 දක්වා අත්හිටුවීම:** සාමාන්‍ය නැවත අයකර ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, එවැනි ණය ගැනුම්කරුවන් සඳහා දි අධික ලෙස ඇමතුම් ලබා දීම /බල කිරීම හෝ ණය ගැනුම්කරු හමුවීම යනාදිය සිදු නොකිරීමට බලපත්‍රලාභී බැංකු සෑම පියවරක් ම ගත යුතුය. ණය අයකර ගැනීම සම්බන්ධව නීතිමය කටයුතු සිදු වෙමින් පවතී නම්, මෙම සහනය ලබා ගැනීම සඳහා ණයගැනුම්කරුවන් උසාවියේදී එකඟතාවයකට පැමිණිය යුතුය.

**අතිරේක සහන**

- රුපියල් 500,000 ට අඩු චෙක්පත්වල වලංගු කාලය 2021.10.31 දක්වා දීර්ඝ කිරීම.

- බලපෑමට ලක්වූ ණය ගැනුම්කරුවන්ගේ සියලු චෙක්පත් ගනුදෙනු සම්බන්ධයෙන් වූ අගරුවූ චෙක්පත් සහ චෙක්පත් ගෙවීම් නතර කිරීම සම්බන්ධ ගාස්තු අයකිරීම 2021.09.30 දක්වා අත්හිටුවීම සහ පැහැදිලි වශයෙන්ම බලපෑමට පත් ගනුදෙනුකරුවන්ගේ ණයපත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීම 2021.10.31 දක්වා අත්හිටුවීම.

- මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දීම.

- මෙම ණය සහන යෝජනා ක්‍රමය සහ මීට පෙර ණය සහන යෝජනාක්‍රම සඳහා සහභාගීවීම මගින් ණය ගනුදෙනුකරුවන්ගේ ණය ශ්‍රේණිගත කිරීම් සඳහා හෝ අනාගත ණය තොරතුරු කාර්යාංශ වාර්තා සඳහා අසතුටුදායක බලපෑමක් සිදු නොවීම.

- දැනට පවතින සංචරණ සීමාවන් හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීම් නියමිත දිනය දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 15 ක් දක්වා) කල් දැමීමට කෙරෙන ඕනෑම ඉල්ලීමක් සලකා බලන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දී ඇත. එවැනි ප්‍රමාදයන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තු අය නොකල යුතුය.

**අයදුම් කිරීමේ අවසාන දිනය:** සහන යෝජනා ක්‍රමය සඳහා ඉල්ලුම් කිරීමට කැමති සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් 2021.09.21 දින හෝ ඊට පෙර ඒ සඳහා බලපත්‍රලාභී බැංකුවෙන් ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉල්ලීමක් කළ යුතුය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලීමක් වුවද, එසේ ප්‍රමාද වීමට හේතු පිළිගත හැකි නම් බාර ගන්නා ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දී ඇත.

**සමාලෝචන ක්‍රියාපටිපාටිය:** අයදුම්පත ප්‍රතික්ෂේප වීමකදී, බලපත්‍රලාභී බැංකු විසින් එවැනි ප්‍රතික්ෂේප කිරීම් හේතු සහිතව, වඩාත් සුදුසු ලෙස දින 14 ක් ඇතුළත පාරිභෝගිකයාට ලිඛිතව දැනුම් දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිචාරය ගැන පාරිභෝගිකයා සෑහීමකට පත් නොවන්නේ නම්, වැඩිදුර සමාලෝචනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ (www.cbsl.gov.lk/fcrd) ඇති පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය භාවිතා කරමින් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට (FCRD) පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.